චක්‍රලේඛ අංක : 01/2011

මගේ අංකය : NSE/Circulars
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
150 ඒ, එල්.එච්.පී. ගොඩතැගිල්ල
තාවල පාර, නුගේගොඩ
2011.01.26

සියලුම පළාත් සමාජ සේවා අධ්‍යක්ෂවරුන්/දිස්ත්‍රික් ලේකම්වරුන්/
ප්‍රාදේශීය ලේකම්වරුන් හා අදාල අනෙකුත් නිලධාරීන් වෙත.

## වැඩිහිටි කමිටු පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා මූල්‍යාධාර ලබාදීම

ඉහත කරුණ සම්බන්ධව යවා ඇති මගේ අංක: NSE/D7/Circulars-VLEC හා 2009.10.15 දිනැති ලිපියට අමතරවයි.

එම ලිපිය මගින් වැඩිහිටි කමිටු පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා ඒවාට මූල්‍යාධාර ලබාදීම සම්බන්ධව අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් කර ඇති නමුත්, එම කරුණු සම්බන්ධව සමහර/ වැඩිහිටි කමිටු හා ක්ෂේත්‍ර මට්ටමේ රාජකාරි කරන නිලධාරීන් විසින් වරින් වර නැවත විමසීම කරනු ලබන හෙයින් මෙම පොදු උපදෙස් මාලාව එවමි.

I ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම හා ලියාපදිංචි කිරීම.

I ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි නොපමාව ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටු විය යුතු අතර, ඒවා ලියාපදිංචි කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් කල යුතුය. ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලිප. 01 දරණ ආකෘතිය හා සහතික පත්‍රය භාවිතා කල යුතු අතර, එසේ ලියාපදිංචි කල හැක්කේ එක් ග්‍රාම නිලධාරි වසමකට එක් වැඩිහිටි කමිටුවක් පමණි.

II ග්‍රාමීය වැඩිහිටි කමිටුවක සාමාජිකයන් විය හැක්කේ, අදාල වසම තුල ස්ථිර පදිංචිය ඇති වයස අවුරුදු 60 හෝ ඊට වැඩි ශ්‍රීලාංකික වැඩිහිටියන් පමණි. අවශ්‍යනම් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන වයස අවුරුදු 60ට අඩු එහෙත් ඊට ආසන්න වයස්වල පසුවන තැනැත්තන්ට ද ග්‍රාමීය වැඩිහිටි කමිටුවලට සම්බන්ධ වී සහයෝග කිරීමට හැකි නමුත්, ග්‍රාමීය වැඩිහිටි කමිටුවල නිලවරණ වලදී ඡන්දය දීමට හෝ නිලතල සඳහා තරග කිරීමට හෝ ඒවායේ නිලතල දැරීමට ඔවුන්ට හිමිකමක් නොමැත. එසේම රජය විසින් වැඩිහිටියන් සඳහා ලබාදෙන ස්වයං රැකියා ආධාර, වැඩිහිටි හැඳුනුම්පත් හා අනෙකුත් වරප්‍රසාදයන් ඔවුන්ට හිමි නොවේ.

III ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය වැඩිහිටි කමිටුවලට එකවරක් පමණක් ගෙවනු ලබන රු.5000.00 ආධාර මුදල ලබා දිය හැක්කේ යම් ග්‍රාම නිලධාරි වසමක පිහිටුවා ඇති එක් ග්‍රාමීය වැඩිහිටි කමිටුවක් සඳහා පමණි. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව නියමිත ආකෘතිය මගින් අදාල ග්‍රාමීය වැඩිහිටි කමිටුව පිළිබඳ සියලු තොරතුරු ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට දන්වා එවන්න. තවද එකී ග්‍රාමීය වැඩිහිටි කමිටුව නමින් ඉතිරි කිරීමේ බැංකු ගිණුමක් තිබිය යුතු අතර, අවම වශයෙන් එහි රු.3500.00 ක මුදල් ශේෂයක් පවත්වා ගෙන යා යුතුය.

IV ග්‍රාමීය වැඩිහිටි කමිටුවල කටයුතු සම්බන්ධ පූර්ණ අධීක්ෂණය ප්‍රාදේශීය ලේකම් විසින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් විධිමත්ව බලය පවරන ලද නිලධාරියකු විසින් කල යුතුය.

2. ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල පිහිටුවීම හා ලියාපදිංචි කිරීම.

I. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ලියා පදිංචි සියලුම ග්‍රාමීය වැඩිහිටි කමිටු නියෝජනය වන පරිදි ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල පිහිටු විය යුතුය. තමුත් ප්‍රාදේශීය බල මණ්ඩලය පිහිටුවීමට පෙර අවම වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඇති ග්‍රාම නිලධාරී වසම්වලින් තුනෙන් දෙකක ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවා අවසන් කල යුතුය. එහෙත් දැනටමත් ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩලය පිහිටුවා ඇති නමුත් අවශ්‍ය අවම ග්‍රාමීය වැඩිහිටි කමිටු සංඛ්‍යාව පිහිටුවා අවසන් කර නැත්නම් නොපමාව ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවා අවසන් කල යුතුය.

II. එසේ පිහිටුවනු ලබන ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩලය ලියාපදිංචි කිරීම හා ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් කල යුතු අතර, ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලිප. 02 දරණ ආකෘතිය හා සහතික පත්‍රය භාවිතා කල යුතුය. තවද එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුල පිහිටුවිය හැක්කේ එක් ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩලයක් පමණි.

III. ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් එක් වරක් පමණක් ගෙවන රු.7500.00ක මුදල ලබා ගැනීම සඳහා නියමිත තොරතුරු ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට දන්වා එවිය යුතුය. තවද ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩලය නමින් ඉතිරි කිරීමේ බැංකු ගිණුමක් ආරම්භ කොට තිබිය යුතු අතර, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ලබා දෙන මුදල උපයෝගී කොට ගෙන රු.4000.00ක අවම ගිනුම් ශේෂයක් පවත්වා ගෙන යා යුතුය.

IV. ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩලයේ කටයුතු සම්බන්ධ පූර්ණ අධීක්ෂණය ප්‍රාදේශීය ලේකම් විසින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් විධිමත්ව බලය පවරන ලද නිලධාරියකු විසින් කල යුතුය.

V. දිස්ත්‍රික්කයක ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල පිහිටුවා අවසන් කල පසු දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩලය දිස්ත්‍රික් ලේකම් විසින් පිහිටුවනු ඇත. එහෙයින් ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල පිලිබඳ සියලු තොරතුරු ප්‍රාදේශීය ලේකම් විසින් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට පිටපතක් සහිතව අදාල දිස්ත්‍රික් ලේකම් වෙත යැවිය යුතුය.

3. දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල පිහිටුවීම හා ලියාපදිංචි කිරීම.

I. දිස්ත්‍රික්කයක ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල පිහිටුවා අවසන් කල පසුව ඒවායේ නියෝජනයෙන් දිස්ත්‍රික් බලමණ්ඩලය පිහිටුවා එම තොරතුරු ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයට දන්වා එවිය යුතුය. දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩලය පිහිටුවීමේදී එහි නිලධාරී මණ්ඩලය, ප්‍රාදේශීය බලමණ්ඩලවල නිලධාරීන්ගේ හා කාරක සභිකයන්ගේ සහභාගීත්වයෙන් හා ඔවුන්ගේ ඡන්දයෙන් තෝරාපත් කල යුතුය. දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය වැඩිහිටි බලමණ්ඩල සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් බලමණ්ඩලයේ සංයුතිය තීරණය කිරීම මැනවි.

II. දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩලයක කටයුතු පූර්ණ අධීක්ෂණය දිස්ත්‍රික් ලේකම්වරයාට පැවරේ. ඒ අනුව එහි කටයුතු සෘජුව දිස්ත්‍රික් ලේකම් විසින් හෝ දිස්ත්‍රික් ලේකම් විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියකු විසින් කල හැකිය.

III දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් රු.15000.00ක උපරිමයකට යටත්ව ලබා දෙන ආධාර මුදල දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව අදාල තොරතුරු එවීමෙන් පසුව පමණක් ගෙවනු ලැබේ. ඒ සඳහා දිස්ත්‍රික් බලමණ්ඩලය සක්‍රිය තත්ත්වයේ තිබිය යුතු අතර, එනමින් ගනුදෙනුකිරීමේ බැංකු ගිනුමක් ආරම්භ කොට පවත්වා ගෙන යා යුතුය. කෙසේ නමුත් එකී ආධාර මුදල ලබාදීමට පෙර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය වැඩිහිටි මණ්ඩල පිහිටුවා අවසන් කර තිබීම අනිවාර්ය අවශ්‍යතාවයකි. කෙසේ නමුත් රු.15000.00 ආධාර මුදල ලබාදීම පිළිබඳ වැඩිමනත් උපදෙස් ඉදිරියේදී ලබා දෙනු ඇත.

IV දිස්ත්‍රික් බලමණ්ඩල ලියාපදිංචි කිරීම හා ලියාපදිංචි සහතිය. නිකුත් කිරීම දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය මත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් කරනු ඇත. ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් නිකුත් කරන ලිප. 03 දරණ ආකෘති පත්‍රය මගින් අයදුම් කල යුතු අතර, ඒ පිළිබඳව වැඩිමනත් තොරතුරු ඉදිරියේදී දන්වා එවනු ලැබේ.

I පළාත් වැඩිහිටි බලමණ්ඩල පිහිටුවීම

I යම් පලාතක් තුල ඇති සියලු දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් වැඩිහිටි බලමණ්ඩල පිහිටුවා අවසන් කල පසු පලාත් වැඩිහිටි බලමණ්ඩලය පිහිටුවීමට ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් අවශ්‍ය පියවර ගනු ලැබේ.

ජේ.ක්‍රිෂ්ණමූර්ති
අධ්‍යක්ෂ